# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2022 මාර්තු මස 25 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2022.03.28 දින නිකුත් කරන ලදී)**

## වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය" යනුවෙන් හඳුන්වන සහ හඳුනාගන්නා සංගමයක් එකී සාමාජිකයින් විසින් එකඟ වූ නීතීන්ට අනුකූලව, එම සංගමයේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද;

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් මහජනතාවගේ සුභසාධනය සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක     දරන වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුවත් (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමයේ සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) "වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිත කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

3. සංස්ථාපිත මණ්ඩලයේ පොදු අරමුණු පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කෙරේ:—

(අ) අද්විතීය ප්‍රදේශවල ජාතික හා ප්‍රජා මට්ටමේ සමාජ-ආර්ථික පර්යේෂණ සිදු කිරීම;

(ආ) ප්‍රජාවට සහ ජාතියට සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සකස් කිරීමට උපකාරී වන අධ්‍යයන සඟරා, වාර්තා සහ පොත් තුළින් පර්යේෂණ අධ්‍යයනයේ සොයා ගැනීම් බෙදාහැරීම;

(ඇ) විවිධ අංශවල ශාස්ත්‍රීය හා වෘත්තීයවේදීන් සම්බන්ධ කරමින් රටේ ජනතාව අතර, අන්තර් ආගමික හා අන්තර් සංස්කෘතික සමගි සබඳතාවක් ඇති කර ගැනීම.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු, මෙම පනතේ අනෙකුත් විධිවිධානවලට අනුකූලව සහ සංගමයේ දැනට ක්‍රියාත්මක වන නීතිරීති වලට අනුකූලව තේරී පත් වූ සභාපති (මූලාසනධාරී), භාණ්ඩාගාරික සහ කමිටු සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් මෙම පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සිට ප්‍රථම කළමනාකරණ කමිටුව කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) විධායක කමිටු රැස්වීමක් සඳහා වන ගණපූරණය කමිටු සාමාජිකත්වයෙන් තුනෙන් එකක් වනු ඇත.

(4) මෙම පනතේ විධිවිධානයන්ට සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, සංස්ථාපිත මණ්ඩලයේ දේපල ප්‍රවර්ධනය කිරීම හෝ ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය හෝ අපේක්ෂා කරන එවැනි ඕනෑම ක්‍රියාවක්, කාරණයක් සහ ඕනෑම දෙයක් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලයට බලය ඇත. බැංකු ගිණුම් විවෘත කිරීමට ක්‍රියාත්මක කිරීමට හෝ අවලංගු කිරීමට ඇති බලතල ඇතුළුව, සංස්ථාවට අරමුදල් ආයෝජනය කිරීම සඳහා අරමුදල් සහ පරිත්‍යාග ලබා ගැනීම හෝ එකතු කිරීම හෝ ලබා ගැනීම හෝ භාර ගැනීම සඳහා ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නිරත කිරීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් නෙරපීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**5.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, චර්යාව සහ කාර්ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණ කමිටුවේ හෝ යම් අනුකමිටුවල රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම, පැවැත්වෙන කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම් පිළිබඳ දැන්වීම සහ න්‍යාය පත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයින්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාන්‍ය කටයුතු කළමනාකරණය සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන පරිද්දෙන් හා එවැනිම වූ රැස්වීමක දී සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයින් සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු සහ සංස්ථාපිත මණ්ඩලයට අයවිය යුතු ණය

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සංගමය විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එම දිනයේ දී සංගමයට අයවිය යුතු සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල් සහ දායක මුදල් මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**7.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග හෝ රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාව වෙත හෝ සංස්ථාව වෙනුවෙන් ලැබෙන මුදල් යයි එකී සඳහන් කරනු ලැබූ සියලුම මුදල්, සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාව විසින් එහි බලතල, රාජකාරී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී කාර්ය සාධනය කිරීමේ දී හා ඉටුකිරීමේ දී යම් වියදමක් දැරීමට අවශ්‍ය සියලුම මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණනය

**8.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මූල්‍ය වර්ෂය ලිත් (කැලැන්ඩර) වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය වෙත ලැබුණු ආදායම් හා සිදුකළ වියදම්, සියලුම මුදල් ගණුදෙනු සඳහා නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, සංස්ථාවේ ආදායම් සහ වියදම්, ගිණුම් සහ ශේෂ පත්‍රවල නිවරද්‍යතාව කළමනාකාර කමිටුව විසින් පත් කරනු ලබන සභාව තීරණය කරන පරිදි සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ “සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් ස්ථාපිත කර ඇති වෙනත් ආයතනයක සාමාජිකයකු වශයෙන් සිටින සෑම නේවාසික හවුල්කරුවෙකුම ගණකාධිකාරීවරයකුගේ ආයතනයක් විසින් එම ආයතනයේ කවුන්සිලය මගින් ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාපිත මණ්ඩලය විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, සංගමයේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාපිත මණ්ඩලය සතු වන්නේ ය.

සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**10.** සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංගමයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව*

**11.** සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම*

**12.** මේ පනතේ සඳහන් කිසිවක් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට හානියක් හෝ අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.